297337

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,169 - 2001 ජනවාරි 26 වැනි සිකුරාදා - 2001.01.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස – පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... ... ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත් කිරීම් ආදිය ... ... ... | – |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... ... | 300 |
| සනතුරු – ඇබෑර්තු ... ... | 309 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | – |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| කොටුපළ්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | – |
| විවිධ දැන්වීම් ... ... | – |


*සැ. යු.–* ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත, තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත, කුඩා තේ වතු සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පත සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2000 නොවැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. සනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2001 පෙබරවාරි මස 02 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යායුතු දැන්වීම් 2001 ජනවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2001 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


299-B 078091 - 8,500 (2001/01)

297337



# පළාත් සභා නිවේදන

මගේ අංකය : සීපීසී/ඒඑස්/ඊ/1/2000/1.

## මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී යෝජිත ප්‍රඥප්තිය

මධ්‍යම පළාත් සභාව මගින් 2000 ඔක්තෝබර් මස 19 දින ගරු සභාවට ඉදිරිපත් කරන ලද 2000 අංක 01 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී යෝජිත ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ අතර, ඊට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2000.12.20 දින ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. සකලසූරිය,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

18 MAY 2001
SRI LANKA

2000 දෙසැම්බර් මස 27 වැනි දින,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව,
තැ. පෙ. අංක 07,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

## මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය

පෙරවදන. මධ්‍යම පළාත ඇතුළත මගී ප්‍රවාහන සේවාවන් ද, මධ්‍යම පළාතට අදාල වන ප්‍රමාණයට මධ්‍යම පළාත හා සම්බන්ධ වන අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවාවන් ද විධිමත් කිරීම හා එම කාර්යයට අනුෂංගික වන අනෙකුත් කාර්යයන් සඳහා ද, එකී විධිමත් කිරීමේ අරමුණ ඉටු කර ගැනීම උදෙසා මධ්‍යම පළාතට "මගී ප්‍රවාහන සේවා අධිකාරිය" නමින් අධිකාරියක් ස්ථාපනය කිරීම සඳහා ද, එකී අධිකාරිය මගින් 1992 අංක 4 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය හා එහි සංශෝධන සහ එකී ප්‍රඥප්තිය යටතේ වන නියෝග ක්‍රියාත්මක කිරීම, බලාත්මක කිරීම සහ/හෝ යෝග්‍ය පරිදි සංශෝධනය කරවීම සඳහා ද වන ප්‍රඥප්තියකි.

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය. 1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 2000 වර්ෂයේ අංක 01 දරන "මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය" යන නමින් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක දිනය. 2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය.

### 1 වැනි කොටස

### *මධ්‍යම පළාත සඳහා මගී ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවීම*

අධිකාරිය. 3. මෙම ප්‍රඥප්තියේ මින් මතු "අධිකාරිය" යන නමින් සඳහන් කරනු ලබන "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය" යන නාමයෙන් හැඳින්වෙන පළාත් අධිකාරියක් පිහිටවනු ලැබේ.

4. තුන්වෙනි වගන්තියේ සඳහන් නාමයෙන් අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

උප කාර්යාල. 5. අධිකාරිය විසින් සිය අභිමතය පරිදි, අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මධ්‍යම පළාත ඇතුළත මගී ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීමේ විෂයට අදාල කාර්යයන් හා බලතල පැවරීම, විමධ්‍යගත කිරීම සහ අධිකාරියේ උප කාර්යාල යෝග්‍ය ස්ථානවල පිහිටුවා පවත්වාගෙන යාම කරනු ලැබිය හැකිය.

අධිකාරියේ සංයුතිය. 6. (අ) අධිකාරිය, අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත කෙරෙන සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් යුක්ත විය යුතු අතර එයින් පස් දෙනෙකු "නිල බලැති සාමාජිකයින් ද හය දෙනෙකු "පත්කල සාමාජිකයින්ද" විය යුත්තේ ය.

(ආ) අධිකාරියේ සියලු සාමාජිකයින්, අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත් කරනු ලැබිය යුතු වන්නේ ය. එවැනි සියළු පත්වීම් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුත්තේ ය.

නිලබලැති සාමාජිකයින්. (ඇ) නිල බලයෙන් පත් කරනු ලබන අධිකාරියේ සාමාජිකයින් පහත සඳහන් අය විය යුතුය.

(1) මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ යෝග්‍ය යයි තමා සලකන්නේ නම් තමා වෙනුවට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ලේකම්වරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

297337



(2) මඟී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ සේවයේ නියුතු සහකාර ලේකම් තත්වයට නොඅඩු ඇමතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු නිලධාරියෙකු

(3) මුදල් විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරයෙකු.

(4) මධ්‍යම පළාත භාර නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරිවරයෙකු හෝ ඊට වඩා උසස් නිලධාරියෙකු.

(5) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙකු.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ පුවත්පත් පත්‍ර
ලියාපදිංචි කාර්යාලය
18 MAY 2001
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා

(ඉ) අධිකාරියේ "පත් කළ සාමාජිකයින්" පහත සඳහන් අය විය යුතුය.

(1) ප්‍රවාහනය, ආර්ථික විද්‍යාව, පරිපාලනය හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍ර වලින් එකක හෝ වැඩි ගණනක පුළුල් පළපුරුද්දක්, සුදුසුකම් හෝ හැකියාවක් දක්වා ඇත්තා වූ බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන පුද්ගලයන් තිදෙනෙකු.

(2) මධ්‍යම පළාතේ මඟීන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අභිමතය පරිදි තෝරා ගනු ලබන තැනැත්තෙකු.

(3) මධ්‍යම පළාතේ පෞද්ගලික බස් හිමියන් නියෝජනය කිරීම සඳහා මධ්‍යම පළාත සඳහා වූ බස් හිමියන්ගේ සංගමයෙන් නම් කරනු ලබන තැනැත්තෙකු.

(4) ඇමතිවරයාගේ අභිමතය පරිදි තීරණය කරනු ලබන පහත දැක්වෙන නිලධාරීන්ගෙන් එක් අයෙක්.

(අ) (i) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති විසින් නම් කරනු ලබන ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරයෙකුගේ නිල තත්ත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ; හෝ

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවට අනුප්‍රාප්තික වන ජාතික මට්ටමේ හෝ ප්‍රාදේශීය මට්ටමේ සංවිධානයක ප්‍රධානියා හෝ ප්‍රාදේශීය ප්‍රධානියා විසින් නම් කරනු ලබන ඉහත (අ) (1) උපවගන්තියේ සඳහන් නිල තත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ; හෝ

(ආ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ නිල තත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

7. (අ) අධිකාරියේ සාමාජිකයින් අතුරින් එක් තැනැත්තෙකු අධිකාරියේ සභාපති වශයෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය. *අධිකාරියේ සභාපති.*

(ආ) අධිකාරියේ විධායක බලය සභාපතිවරයාට පැවරෙන්නේ ය. එකී බලය අධිකාරියේ එකඟත්වය ඇතිව අධිකාරියේ නිල බලැති සාමාජිකයෙකුට හා/හෝ 26 වැනි වගන්තියේ සඳහන් සාමාන්‍යාධිකාරිවරයා වන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාට අවස්ථාවෝචිත පරිදි පවරා දෙනු ලැබිය හැකිය. *අධිකාරියේ විධායක බලය.*

(ඇ) පවරා දෙනු ලැබ ඇති කිසියම් විධායක බලයක් හදිසි අවස්ථාවක දී තමා විසින්ම ක්‍රියාත්මක කරනු ලැබීමට සභාපතිට බාධාවක් නොමැති විය යුතුය. *හදිසි අවස්ථා බලතල.*

8. යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ කිසියම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු වේ නම් හෝ, එවැන්නකු ලෙස පත්වේ නම් හෝ ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය. *සාමාජිකයකුවීමට නුසුදුසුකම්.*

9. යම් තැනැත්තෙකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට ප්‍රථම ඒ තැනැත්තා විසින් එකී අධිකාරියේ සාමාජිකයෙකු ලෙස ඔහුගේ කර්තව්‍යය ඉටු කිරීම කෙරෙහි ප්‍රතිවිරුද්ධ ලෙස බලපෑ හැකි මූල්‍යමය හෝ, වෙනත් ආකාරයේ සම්බන්ධතා හෝ උනන්දුන් රජයට හෝ කිසියම් පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට අදාලව ඔහු සතුව නොමැති බවටඅමාත්‍යවරයා සෑහීමකට පත්විය යුතුය. කිසියම් සාමාජිකයෙකු සතුව එවැනි සම්බන්ධතා හෝ උනන්දුන් නොමැති බවට අමාත්‍යවරයා කලින් කළ සෑහීමකට පත්විය යුතුය. සාමාජිකයකු වශයෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ, සාමාජිකයකු වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයා අදහස් කරන යම් තැනැත්තෙකු හෝ, මෙම වගන්තිය යටතේ තමාගේ කාර්යභාරය ඉටු කිරීම සඳහා තමාට අවශ්‍යයයි අමාත්‍යවරයා සලකන තොරතුරු අමාත්‍යවරයාට සැපයිය යුතු වන්නේ ය. *අමාත්‍යවරයාට තොරතුරු සැපයීම.*

10. (1) අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන යම් කොන්ත්‍රාත්තුවකට සෘජුව හෝ වක්‍රව, කුමන ආකාරයක හෝ සම්බන්ධතාවයක් ඇති අධිකාරියේ කුමන හෝ සාමාජිකවයකු එම සම්බන්ධතාවය අධිකාරියේ ආසන්නතම රැස්වීමකදී අනාවරණය කළයුතු අතර, එසේ අනාවරණය වූ කරුණු රැස්වීමේ වාර්තාවෙහි වාර්තා කළයුතු වන්නේ ය. තවද, එකී සම්බන්ධතාවයන් ඇති සාමාජිකයා එම කොන්ත්‍රාත්තුව පිළිබඳ කිසිම සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතුය. *අධිකාරියේ කොන්ත්‍රාත්තු*

11. මෙහි 12 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, පළාත් ප්‍රවාහන අධිකාරියේ සෑම පත්කළ සාමාජිකයෙකුගේම ධුර කාලය පත්වීම ක්‍රියාත්මක වූ දින සිට අවුරුදු තුනක් විය යුතු අතර, කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය. *අධිකාරියේ පත්කළ සාමාජිකයින්ගේ ධුර කාලය.*

එසේ වුවද අධිකාරියේ පත්කළ සාමාජිකයකුගේ පුරප්පාඩුවකට පත් කරනු ලබන සාමාජිකයෙකු ඔහු කලින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ අන් ආකාරයකින් ධුරය හිස් කළහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු වන්නේ ය.

අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම.

12. (1) ඉහත 6(ඉ)(1), (2) හෝ (3) උපවගන්ති යටතේ පත්කල සාමාජිකයකු අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් ඉවත් කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් 12(1) වැනි උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ පළාත් අධිකාරියේ යම් පත්කල සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයේ ඒ සාමාජිකයා ඔහුගේ ධුරයෙන් ඉවත්විය යුතුය.

පත්කල සාමාජිකයින් ඉල්ලා අස්වීම.

13. අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් අධිකාරියේ සභාපතිට හෝ අධිකාරියේ පත්කල සාමාජිකයකුට සිය තනතුරින් ඉල්ලා අස්විය හැකිය.

පත්කල සාමාජිකයකු නොමැතිවීම.

14. අධිකාරියේ සාමාජිකයකු හෝ සභාපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම්කිසි හේතුවක් නිසා හෝ තාවකාලිකව සිය තනතුරේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවලදී මෙහි 6 වැනි වගන්තියේ විධි විධාන කෙරෙහි සැලකිලිමත්ව ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

පත්කල සාමාජිකයින්ට පාරිශ්‍රමික.

15. ප්‍රවාහන අධිකාරියේ සාමාජිකයින්ට සහ සභාපතිට, මධ්‍යම පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික දීමනා සහ වෙනත් ගෙවීම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

රැස්වීම්වල මූලාසනය දැරීම.

16 (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින අධිකාරියේ සෑම රැස්වීමකදීම ඔහු මූලාසනය දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තමන් අතුරෙන් වැඩි ඡන්දයෙන් සාමාජිකයකු තෝරා ගත යුතුය.

ගණපූරණය.

(2) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සභාපති ද ඇතුළු මුළු සාමාජික සංඛ්‍යාවෙන් පුරප්පාඩු සාමාජික සංඛ්‍යාව හැර ඉතිරි සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවට වැඩිවිය යුතුය.

තීරක ඡන්දය.

(3) අධිකාරියේ කවර හෝ රැස්වීමකදී මූලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

රැස්වීම් වාර හා ක්‍රියා පටිපාටිය.

(4) අධිකාරියේ රැස්විය යුතු වන වාර ගණන සහ රැස්වීම් පැවැත්වීම හා අධිකාරියට මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇති අභියාචනා සලකා බැලීම ද ඇතුළුව රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටි අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකිය. තවද යම් සාධාරණ කරුණක් නිසා රැස්වෙන ලෙස අමාත්‍යවරයාගෙන් ලැබෙන නිවේදනයක් අනුව ද අධිකාරිය රැස්විය යුතු වන්නේ ය.

පුරප්පාඩු තිබුණද අධිකාරියට ක්‍රියා කළ හැකි බව.

17. අධිකාරියේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද අධිකාරියට ක්‍රියාකල හැකි අතර, එවැනි පුරප්පාඩුවක් හෝ අධිකාරියේ කිසියම් සාමාජිකයකු පත්කිරීමේ ලා යම් දෝෂයක් හෝ තිබීමේ හේතුව නිසාම පමණක් අධිකාරියේ කිසියම් ක්‍රියාවක් ක්‍රියා මාර්ගයක් හෝ තීරණයක් අවලංගු හෝ නිර්බල වීමක් නොවිය යුතුය.

අධිකාරියේ මුද්‍රාව.

18. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැකිය.

(3) අධිකාරියේ මුද්‍රාව එම අධිකාරියේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සාක්ෂි වශයෙන් ඒ සාමාජිකයින් දෙදෙනාම ඒ සාධන පත්‍රයේ හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

## II වැනි කොටස

### *අධිකාරිය සතු බලතල, කාර්ය භාරය හා කාර්යය මණ්ඩලය*

බලතල හා කාර්යභාරය.

19. පළාත් අධිකාරියට මතු දැක්වෙන බලතල හා කාර්යයන් පැවරෙන්නේ ය.

ප්‍රමිති විපරම් කිරීම.

(අ) මධ්‍යම පළාත ඇතුළත හා මධ්‍යම පළාත සම්බන්ධීතව මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හා පිළිගත හැකි ගුණත්වයකින් යුත් බස්රථ සේවයක් පවතින්නේ ද යන වග පිළිබඳව පරීක්ෂාකාරී වීම හා සමීක්ෂණය කිරීම, සහ එම සේවාවන්ට අදාල ප්‍රමිතීන් නියම කිරීම;

කාල සටහන්.

(ආ) මධ්‍යම පළාත ඇතුළත මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා බස්රථ ධාවනය සඳහා කාලසටහන් "නියම කිරීම" එම කාල සටහන් අනුව ධාවන කටයුතු කළ යුතු බවට ධාවකයන්ට නියම කිරීම, හා ධාවකයන් එම කාලසටහන් අනුගමනය කරන්නේ ද යන වග පිළිබඳ සමීක්ෂණය කිරීම හෝ කරවීම;

මගී සේවා අවසරපත් රෙගුලාසි.

(ඇ) මධ්‍යම පළාත ඇතුළත මගී ප්‍රවාහනය සඳහා බස්රථයක් යොදා ගැනීමට කිසියම් පුද්ගලයෙකුට බලය දෙන මගී සේවා අවසර පත්‍රයක් හෝ එවැනි වෙනත් අධිකාරයක් නිකුත් කිරීම, අලුත් කිරීම, සංශෝධනය කිරීම හා අවලංගු කිරීම පිළිබඳ රෙගුලාසි පැනවීම ;

(ඇ) (3) වැනි උපවගන්තියේ සඳහන් අවසර පත්‍ර හෝ වෙනත් අධිකාරී වලට අදාල වන කොන්දේසි නියම කිරීම, අවසර පත්‍රලාභීන් හෝ ඔවුන්ගේ සේවකයින් එම කොන්දේසි පිළිපදින බවට අවලෝකනය කිරීම ; කොන්දේසි.

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ යම් අරමුණක් සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු හා වාර්තා අධිකාරිය වෙත සපයන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ මගී සේවා අවසර පත්‍ර ලාභියකු වන තැනැත්තෙකුට නියම කිරීම ; තොරතුරු සැපයීම.

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවලට අදාල වන්නා වූ නිකුත් කිරීම්, අලුත් කිරීම්, සංශෝධනය කිරීම හා ඒවාට අදාල වෙනත් කාර්යයන් සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු නියම කිරීම හා වරින් වර සංශෝධනය කිරීම ; ගාස්තු.

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස් රථයක ප්‍රදර්ශණය කළයුතු ගමනාන්ත නාමපුවරු, සළකුණු හා සංඥක පිළිබඳ රෙගුලාසි පැනවීම ; ගමනාන්ත නාම පුවරු ආදිය.

(ඌ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස්රථ වල රියදුරන් හා/හෝ කොන්දොස්තරවරුන් විසින් රැගෙන යා යුතු හෝ තබාගත යුතු ලියකියවිලි හා ඒවායේ සටහන් කළ යුතු තොරතුරු නියම කිරීම ; බස්රථයේ ලියකියවිලි.

(එ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස්රථයක, අවසර පත්‍ර ලාභියා විසින් පවත්වා ගෙන යායුතු ගුණාත්මක බව හා යෝග්‍යතාවය පිළිබඳ ප්‍රමිති සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීම සහ එම නියමයන් උල්ලංඝනය කිරීම හෝ නොසලකා හැරීම වෙනුවෙන් ගතයුතු පියවර නියම කිරීම ; බස්රථයේ යෝග්‍යතාවය.

(ඒ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන බස් රථයක සේවා ගමන් වාර සම්බන්ධයෙන් තබා ගතයුතු හෝ නඩත්තු කළයුතු වාර්තා නියම කිරීම ; වාර්තා.

(ඔ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එකී අවසර පත්‍රයේ අධිකාරය යටතේ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන බස්රථයක රියදුරු හා කොන්දොස්තර ලෙස සේවයේ යොදවනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් සහ එම තැනැත්තන්ගේ සේවය ආරම්භ කිරීමේ හා නිම කිරීමේ වේලාවල් හා ඔවුනට ලබාදෙන විවේක වේලාවල් සම්බන්ධයෙන් ද "වේතන" දීමනා හෝ ගාස්තු සම්බන්ධයෙන් ද තබාගත යුතු පවත්වාගෙන යායුතු හෝ අධිකාරියට ඉදිරිපත් කළයුතු වාර්තා නියම කිරීම ;

(ඕ) මධ්‍යම පළාත තුළ ඇති සියලුම බස් නැවතුම්පොලවල් හා එහි පිහිටි ගොඩනැගිලි මධ්‍යම පළාතේ ප්‍රවාහන අධිකාරිය සතු වන්නේ ය. ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිත්‍යානුකූල අවසරයක් නොමැතිව කිසිම ඉදිකිරීමක් කළ නොහැකිය. එම බස් නැවතුම්පොලවල නාම ලේඛනය උප ලේඛනය 1 වශයෙන් මෙම ප්‍රඥප්තියේ අමුණා ඇත. මධ්‍යම පළාත තුළ බස්නැවතුම්පොලවල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම - සංවර්ධනය කිරීම, වෙනස් කිරීම සහ වසා දැමීම ඒවායෙහි මගී ආවරණ ඉදිකිරීම, එම ස්ථානවලට ආරක්ෂාව සැපයීම බස් නැවතුම්පොල භූමියේ මායිම් තුළ ඇති හිස් ඉඩකඩ ප්‍රයෝජනයට ගැනීම ; බස් නැවතුම්පොලවල් හා මාර්ගස්ථ නැවතුම්.

(ක) බස් නැවතුම්පොල වල බස් රථ ධාවන කළමනාකරණ කටයුතු, කාල සටහන් ක්‍රියාත්මක කිරීම, බස් ගමන් වාර ආරම්භක ස්ථාන නියම කිරීම, එකී කළමනාකරණ කටයුතු සඳහා බස් නැවතුම්පොල ස්ථාන භාර නිලධාරීන්, වේලා සටහන් කරුවන් හා අවශ්‍ය අනෙකුත් කාර්යය මණ්ඩල යෙදවීම සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ බලතල, කාර්යයන් හා වගකීම් නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම ; බස් නැවතුම්පලවල් ක්‍රියාත්මක කිරීම.

(ග) බස් නැවතුම්පොල වල ධාවන කළමනාකරණ කටයුතු භාර කාර්ය මණ්ඩලය විසින් පවත්වා ගෙන යායුතු වාර්තා සහ ලිපි ලේඛණ හා ඒවායේ සටහන් කළයුතු තොරතුරු නියම කිරීම හා ඒවායේ ආරක්ෂාව පිළිබඳ විධාන දීම ;

(ජ) මධ්‍යම පළාත් සීමාව තුළ මගී ප්‍රවාහනයට සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවන් සෙවීම, වැළැක්වීම හා ඒවාට විරුද්ධව ක්‍රියා කිරීම අරමුණුකොට හදිසි පරීක්ෂණ කණ්ඩායම් ස්ථාපනය කිරීම, හෝ ස්ථාපනය කරවීම, සහ එකී කණ්ඩායම් වල බලතල හා කාර්යයන් නියම කිරීම සහ ඒවාට අදාලව රෙගුලාසි පැනවීම ; නීති විරෝධී මගී ප්‍රවාහනය.

(ට) අධිකාරියේ අරමුණු, හා කාර්යභාරය ඉටුකර ගැනීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි රෙගුලාසි පැනවීම හා එම පරමාර්ථ සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ යම් තැනැත්තෙකු හෝ යම් ආයතනයක් සමග ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට පිවිසීම ; ගිවිසුම් හා කොන්ත්‍රාත්

(ඩ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම, භාරයේ තබා ගැනීම, භාවිතා කිරීම සහ නියම කර ඇත්තාවූ යම් ක්‍රියාමාර්ගයකට අනුකූලව බැහැර කිරීම ; දේපල අත්කර ගැනීම.

(ණ) අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් පහසුකමක් හෝ දේපලක් වෙනුවෙන් ගාස්තු අයකිරීම ; සේවා ගාස්තු.

පරිත්‍යාග

(ක) මුදල්මය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, පරිත්‍යාග සහනාධාර හෝ ත්‍යාග පිළිගැනීම හා ඒවා අධිකාරියේ අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීම ;

රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

(20) මෙම ප්‍රඥප්තිය යටතේ කුමන කරුණක් හෝ සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදනු ලබන කිසියම් රෙගුලාසියක් අමාත්‍යවරයා විසින් සිය අනුමැතියෙන් පසු නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු අතර, එම රෙගුලාසි රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය. තවද අමාත්‍යවරයා විසින් එම රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 45ක් ඇතුළත පළාත් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

කාර්යය මණ්ඩල පිළිබඳ බලතල.

(21) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව, අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම සහ එම කාර්ය මණ්ඩලයට අදාලව මතු දැක්වෙන කාර්යයන් ඉටු කිරීමට අධිකාරිට බලය ඇත :-

(1) අධ්‍යාපනික, වෘත්තීමය හා අනෙකුත් සුදුසුකම් සහ වේතන හා වැටුප් ප්‍රමාණයන් ද ඇතුළුව බඳවා ගැනීමේ පටිපාටි නියම කිරීම.

(2) පත් කිරීම්, උසස් කිරීම්, වැටුප්, වේතන හා අනෙකුත් දීමනා සහ විනය දඬුවම් හා සේවය අහෝසි කිරීම ද ඇතුළු විනය පාලනය, සාමාන්‍ය හැසිරීම, නිවාඩු යනාදී පිරිස් පාලනයට අදාල නියමයන් පැනවීම. (රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතියන පදනම මත පැමිණෙන සේවකයන්ට හැර අධිකාරිය යටතේ සේවය කරන අනෙකුත් කාර්ය මණ්ඩලයට ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ නොවේ.)

(3) කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රම ඇති කිරීම.

(4) අර්ථ සාධක අරමුදල් ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(5) ශුභ සාධක පහසුකම් ක්‍රම ක්‍රියාත්මක කිරීම.

නව පත්වීම් හා තාවකාලික හෝ මුදා හැරීම මත ද්විතියක පදනම පිට හෝ කොන්ත්‍රාත් පදනම පිට සේවයේ යෙදවීමට බලය.

(22) (1) ඉහත 21 ඡේදය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව සේවකයන් අලුතින් බඳවා ගැනීමට ද,

(2) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු නිලධාරීන් සේවකයින්, අදාළ බලධාරීන්ගේ එකඟත්වය ඇතිව ද්විතීයනය හෝ කොන්ත්‍රාත් හෝ වෙනත් පදනමක් පිට තම සේවයට බඳවා ගැනීම සඳහා අධිකාරියට බලය ඇත්තේය.

(3) 1992 අංක 4 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යම් ගිවිසුමක් මත ප්‍රවාහන අධිකාරිය ක්‍රියාත්මක වන දිනය වන විට සතුටුදායක අඛණ්ඩ සේවයක් ඉටුකරන සේවකයින්, ප්‍රවාහන අධිකාරිය පිහිටුවන අවස්ථාවේ දී අධිකාරිය විසින් නියම කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරාලන්නේ නම් ඔවුන් අධිකාරියේ යම් තනතුරකට බඳවා ගැනීමට හැකිය. තවද අවම අධ්‍යාපන සුදුසුකම් නොමැති සේවකයින් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ එකඟත්වය මත පළමු වරට බඳවා ගැනීම සඳහා ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් යම් ප්‍රමාණයකට ලිහිල් කළ හැකිය.

සාමාන්‍ය මුදාහැරීම මත ද්විතීයනය පදනමේ සිටින කාර්ය මණ්ඩලය.

(4) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධාරයෙකු හෝ සේවකයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද්විතීයනය පදනම පිට බඳවා ගනු ලබන අවස්ථාවක,

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තකයින්

(අ) ඔහු අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරන ලද අවස්ථාවේ දී, රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම් ද, එම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම් ද, ඔහු අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින කාලය තුළදී රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රාජකාරි සඳහා නොපැමිණෙන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (1) වැනි වගන්තිය ඔහුට අදාල විය යුතුය. තවද ඔහු අධිකාරියේ සේවයේ නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහාම ඔහුගේ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවිය යුතු වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන මුදලක් අධිකාරියේ අරමුදලින් අවස්ථාවෝචිත පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා භාණ්ඩාගාරයට හෝ පළාත් සභාවේ අරමුදලට හෝ ගෙවනු ලැබිය යුතුය.

රා. සේ. අ. අ. මත සිටින සේවා නියුක්තිකයන්.

(ආ) ඔහු අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරන ලද අවස්ථාවේදී රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකව සිටියේ නම් අධිකාරියට ඔහු කරන සේවය රජයට හෝ පළාත් සභාවට හෝ කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට ඔහු යටත්වන දායක මුදල ඔහු අධිකාරියේ සේවයේ නියුක්තව සිටින කාලය තුළ නොකඩවා ගෙවනු ලැබිය යුතුය. තවද ඔහු වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට රජය හෝ පළාත් සභාව විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ බැරට අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල්වලින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබිය යුතුය.

අධිකාරියට ස්ථිර පදනමක් මත පත් කිරීම.

(5) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ සේවකයෙකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක,

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතුය.

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තිකයන්.

(ආ) ඔහු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේදී රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඔහුගේ නිත්‍ය තනතුරක් ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයේ නම් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ දින සිට ඔහු රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම

ගන්වනු ලැබුවේ යයි සලකා ඔහුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවනු ලැබිය යුතු ප්‍රදානයන් ලැබීමට සුදුසුකම් ලබන්නෙකු සේ සළකනු ලැබිය යුතුය.

(ඇ) ඔහු, වයස නිසා හෝ සෞඛ්‍ය හේතූන් නිසා විශ්‍රාම ගැනීමෙන් හෝ අධිකාරියේ දරන ලද තනතුරක් අහෝසි කිරීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ සේවය අවසන් කරනු ලැබුවහොත් මිස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලැබිය හැකි එවැනි යම් ප්‍රදාන මුදල ඔහුට ගෙවනු නොලැබිය යුතුය.

(ඉ) අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින අතරතුර ඔහුගේ මරණය සිදුවුවහොත් හෝ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීමට පූර්වාසන්නව ඔහුගේ මරණය සිදු වී නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙනුවෙන් ගෙවිය හැකි වන්නා වූ යම් ප්‍රදානයක් ද, අධිකාරියේ සේවය වෙනුවෙන් ගෙවිය හැකි වන යම් ප්‍රදානයක්ද ඔහු වෙනුවෙන් ගෙවනු ලැබිය හැකිය.

අධිකාරියේ සේවයේ සිටියදී මියයාම.

(ඊ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේදී ඔහු රාජ්‍ය සේවා අරමුදල ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් තොරව ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ කැමැත්ත ඇතිව ගිවිසුම අවසන් වීමෙන් රාජ්‍ය සේවය හෝ පළාත් රාජ්‍ය සේවය අත් හරිනු ලැබූ ලෙස ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා සළකනු ලැබිය යුතුය.

රා. සේ. අ. මත සිටින සේවා නියුක්තිකයන්.

(6) යම් නිශ්චිත කාලයක් සඳහා රජයට හෝ පළාත් සභාවට සේවය කිරීමට එකඟවෙමින් රජය හෝ පළාත් සභාව සමඟ ගිවිසුමකට එළඹ සිටින තැනැත්තෙකු අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යයන් සඳහා කරනු ලබන සේවයක් ලෙස සැළකිය යුතුය.

අනිවාර්ය සේවාව.

23. අධිකාරියේ සියළුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

අධිකාරියේ සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සැළකීම.

24. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපනය කරනු ලැබිය යුතුය.

අල්ලස් පනතේ පරමාර්ථ සඳහා අධිකාරිය උපලේඛනගත ආයතනයකි.

25. (අ) අධිකාරිය විසින් 22 වැනි වගන්තිය යටතේ කාර්යය මණ්ඩලය බඳවාගන්නා තෙක්, මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශයට අනුයුක්ත පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂ සහ සහකාර ප්‍රවාහන අධ්‍යක්ෂ පිළිවෙලින්, අධිකාරියේ සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී විය යුතුය.

සාමාන්‍යාධිකාරී අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා.

(ආ) 7(ආ) උප වගන්තිය පරිදි විධායක බලය පවරනු ලබන සාමාන්‍යාධිකාරිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය.

26. අධිකාරියේ පොදු ප්‍රතිපත්තිමය විධානයන්ට යටත්ව, අධිකාරියේ එදිනෙදා කටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ සාමාන්‍ය විනය පාලනය ඇතුළුව පරිපාලනමය කාර්යයන්ද අධිකාරියේ මූල්‍ය පාලනය පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණයද, වෙනුවෙන් වගකීම සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේය.

සාමාන්‍යාධිකාරිවරයාගේ පොදු වගකීම.

27. මේ ප්‍රඥප්තියෙන් අධිකාරියට පැවරෙන යම් බලතල හා කර්තව්‍යයන් අතුරෙන් (රෙගුලාසි සෑදීමේ බලතල හැර) කාර්යක්ෂම පාලනයට අවශ්‍යයැයි අධිකාරිය අදහස් කරන යම් බලතල හා කර්තව්‍යයන් අධිකාරිය විසින් සාමාන්‍යාධිකාරිවරයාට සහ සහකාර සාමාන්‍යාධිකාරිවරයාට පවරා දිය හැකිය. සාමාන්‍යාධිකාරිවරයා සහ සහකාර සාමාන්‍යාධිකාරිවරයා එවැනි බලතල හා කර්තව්‍යයන් අධිකාරියේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළයුතු අතර, එවැනි මඟ පෙන්වීම් හා අධීක්ෂණය අධිකාරිය වෙනුවෙන් එහි සභාපතිවරයා හෝ 7(ආ) වැනි උප වගන්තිය යටතේ බලය පවරනු ලබන නිලබල සාමාජිකයෙකු විසින් ලබාදිය හැකිය. අධිකාරිය විසින් සාමාන්‍යාධිකාරිවරයා වෙත සහ සහකාර සාමාන්‍යාධිකාරිවරයා වෙත කර ඇති යම් පැවරීමක් යම් වලංගු හේතුවක් මත අහෝසි කරනු ලැබිය හැකිය.

සාමාන්‍යාධිකාරිවරයාට පැවරීම.

28. සාමාන්‍යාධිකාරිවරයාගේ බලතල හා කර්තව්‍යයන් අතුරින් ඔහු අවශ්‍යයැයි සලකන පරිදි යම් බලතල හා කර්තව්‍යයන් සභාපතිගේ එකඟත්වය ද ඇතිව අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරිවරයාට සහ වෙනත් යම් සුදුසු සේවා නියුක්තිකයෙකුට ලිඛිතව පැවරිය හැකි විය යුතු අතර, සහකාර සාමාන්‍යාධිකාරිවරයා සහ එවන් සේවා නියුක්තිකයෙකු විසින් එවන් බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම සාමාන්‍යාධිකාරිවරයාගේ අධීක්ෂණය හා විධානයන් යටතේ කළ යුතුය. සාමාන්‍යාධිකාරිවරයා විසින් සභාපතිගේ එකඟත්වය ඇතිව එවැනි පැවරීමක් වලංගු හේතුවක් මත අහෝසි කරනු ලැබිය හැකිය.

සාමාන්‍යාධිකාරී විසින් පැවරීම.

29. අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ඔහු වෙත පවරා ඇති බලතල කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඊට නීති විරෝධී ලෙසින් බාධා පමුණුවන මැදහත් වන, එරෙහිවන හෝ බලපෑම් කරන තැනහොත් එසේ කිරීමට උත්සහ දරන ඕනෑම තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවෙකු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රු. 2,000ක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන සිර දඬුවමකට හෝ යටත් විය යුතුය.

අධිකාරියට බාධා කිරීම බලපෑම් කිරීම.

## III වැනි කොටස

### *මුදල්*

30. අධිකාරියට ඊටම අයත් අරමුදලක් තිබිය යුතුය.

අධිකාරියේ අරමුදලට බැර.

31. පහත දැක්වෙන මුදල් අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(i) අධිකාරිය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම මගින් ලැබෙන, එක්රැස් කරනු ලබන හෝ අය කරනු ලබන සියළු මුදල්. ;

(ii) මධ්‍යම පළාත් සභාව විසින් වෙන් කර දෙනු ලබන සියළු මුදල්. ;

(iii) කුමන හෝ මූලාශ්‍රයකින් අධිකාරියට ගාස්තු, ආධාර, පරිත්‍යාග, ප්‍රදාන හා ණය වශයෙන් ලැබෙන සියළු මුදල්.

ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය.

32. අධිකාරියේ අරමුදලට ලැබීම් ද, ඉන් මුදල් ගෙවීම් ද, පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය පිළිබඳ වගකීම සාමාන්‍යාධිකාරීවරයාට පැවරෙන්නේය.

අධිකාරිය විසින් අරමුදල් උපයෝගී කරගැනීම.

33. අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම වෙනුවෙන් දරන වියදම් සඳහා ද, අධිකාරියේ සාමාජිකයන්ට සහ සේවා නියුක්තිකයන්ට පාරිශ්‍රමික දීමනා සහ අනෙකුත් සෑම ආකාරයකම ගෙවීම් කිරීම සඳහා ද, මෙම ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ද, මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම හා පවත්වාගෙන යාමට සම්බන්ධ සියළු කටයුතු සඳහා ද, බස් නැවතුම්පලවල් හා මගී ආවරණ ඉදිකිරීම, සංවර්ධන, කිරීම, නඩත්තු කිරීම හා ඊට අදාල වන්නාවූ කරුණු සඳහා ද, අමාත්‍ය මණ්ඩලය විසින් වරින්වර අනුමත කරනු ලබන වෙනත් පරමාර්ථ සඳහා ද අධිකාරියට, අධිකාරියේ අරමුදල් උපයෝගී කර ගත හැකි විය යුත්තේය.

අධිකාරිය විසින් ණය ගැනීම.

34. අධිකාරියේ නිශ්චිත පරමාර්ථ සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව ණය මුදල් වශයෙන් මුදල් ලබාගැනීමට අධිකාරියට බලය ඇති අතර, ණය මුදල් ප්‍රමාණය, ආපසු ගෙවීමේ කාලසීමාව, ණය පාලනය වන කොන්දේසි හා ණය ලබාගැනීමට අපේක්ෂිත ආයතනය, පළාත් අමාත්‍ය මණ්ඩලය තීරණය කරන පරිදි විය යුතුය.

මුදල් වර්ෂය.

35. අධිකාරියේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතුය.

අධිකාරියේ ගිණුම් විගණනය

36. අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සියළු මූල්‍යමය ගණුදෙනු හා ඊට අදාල ගිණුම් කාර්ය පරිපාටි සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ, පළාත් විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කල විගණනය කරනු ලැබිය යුතුය.

### *අන්තර් විධිවිධාන*

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය සංශෝධිත අයුරු බලපැවැත්විය යුතු බව.

37. (1) අමාත්‍යවරයා විසින් වෙනත් විධිවිධාන පනවන තෙක් හෝ තවදුරටත් අවශ්‍ය වන සංශෝධන කරන තෙක් හෝ 1993 මැයි මස 28 වැනි දින, අංක 769 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1992 අංක 4 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය, මෙම ප්‍රඥප්තියේම අවිච්ඡේද කොටසක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, එකී 1992 අංක 4 දරන ප්‍රඥප්තිය පහත දැක්වෙන අයුරු සංශෝධනය කරන ලද සේ සැළකිය යුත්තේය.

(2)(අ) 2(3) දරන උපවගන්තියේ, "ඇමතිවරයාගේ" යන වචනයට පසු "හා මගී ප්‍රවාහන සේවා අධිකාරියේ" යන වචන එකතු කිරීමෙන්,

(2)(ආ) 17(1) දරන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචනය වෙනුවට "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයා" යන වචනය ආදේශ කිරීමෙන්,

(2)(ඇ) 17(2) දරන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්" යන වචන වෙනුවට "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති" යන වචන ආදේශ කිරීමෙන්,

(2)(ඇ) 17(3) දරන උපවගන්තියේ "ලේකම්වරයා" යන වචන වෙනුවට "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයා" යන වචන ආදේශ කිරීමෙන්,

(2)(ඉ) 17(6) වැනි උපවගන්තියේ "පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ට" යන වචන වෙනුවට "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති" යන වචන ආදේශ කිරීමෙන්,

(2)(ඊ) 24(1) හා 24(2) වැනි උපවගන්ති දෙකෙහිම "අමාත්‍යවරයා" යන වචනය වෙනුවට "අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව, මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින්" යන වචන ආදේශ කිරීමෙන්,

(2)(උ) 24(2)(xiii) වැනි උපවගන්තියේ "තමාට" යන වචනය වෙනුවට, "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියට" යන වචන ආදේශ කිරීමෙන්,

38. මෙම ප්‍රඥප්තියේ 25 වැනි වගන්තිය යටතේ පත් කරනු ලබන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා, අනාගතයේදී වෙනත් නියමයක් කරනු ලබන තෙක්, පෙර කී 1992 අංක 4 දරන ප්‍රඥප්තියේ පරමාර්ථ උදෙසා, මධ්‍යම පළාතේ "පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂවරයා" වන්නේය.

*සාමාන්‍යාධිකාරීවරයා හා පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂවරයා.*

39. අධිකාරිය ක්‍රියාත්මක වන දිනයේ, මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයේ සේවයේ නියුක්ත නිලධාරීන් හා සේවකයින්, එදින සිට ඔවුන්ගේ එකඟත්වය ඇතිව, අධිකාරියේ නිලධාරීන් හා සේවකයන් වශයෙන් සලකනු ලැබිය හැකිය. ඔවුන් පළාත් රාජ්‍ය සේවයෙන් තාවකාලිකව මුදාහැරීම පිට අධිකාරියේ සේවය සඳහා, එකී දින සිට ද්විතීයනය කලා සේ සැළකිය යුතු අතර, මෙම ප්‍රඥප්තියේ 22 වැනි වගන්තිය ඔවුනට අදාල විය යුතුය.

*සේවයේ නියුතු නිලධාරීන් තාවකාලිකව මුදාහැරිය ලෙස සැළකිය යුතුවේ.*

40. මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන අංක 70249 දරන ප්‍රවාහන අත්තිකාරම් ගිණුම, බැරකම් පියවීමෙන් පසු ගිණුමේ ශේෂය අධිකාරියට මාරු කරනු ලැබිය යුතු අතර, එය අධිකාරියේ අරමුදලේ කොටසක් විය යුත්තේය.

*ප්‍රවාහන අත්තිකාරම් ගිණුම.*

41. (1) මධ්‍යම පළාතේ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේද එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරනු ලබන තෙක්, ද්විතීයන පදනම් පිට අධිකාරියේ සේවයේ යොදවනු ලබන කාර්ය මණ්ඩලයට නියමිත පෞද්ගලික පඩි නඩි, දීමනා හා අනෙකුත් ගෙවීම්, මගී ප්‍රවාහන සේවා විෂය භාර පළාත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන වලින් ගෙවනු ලැබිය යුතුය.

*ද්විතීයනය කළ නිලධාරීනට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම.*

(2) මධ්‍යම පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරනු ලබන තෙක්, ඉහත (1) වැනි උප වගන්තියේ සඳහන් කාර්යය මණ්ඩලය හැරුණු විට, අනෙකුත් සේවා නියුක්තිකයන්ට නියමිත වේතන, දීමනා හා වෙනත් ගෙවීම් ඉහත 40 වැනි වගන්තියේ සඳහන් අත්තිකාරම් ගිණුමේ මුදලින් ගෙවනු ලැබිය යුතු වේ.

*අනෙකුත් කාර්ය මණ්ඩලයට ගෙවීම.*

42. මධ්‍යම පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාද විමසා අමාත්‍යවරයා වෙනත් අයුරකින් තීරණය කරන තෙක්, 41 වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව, මෙම ප්‍රඥප්තියේ ඕනෑම පරමාර්ථයක් සඳහා අධිකාරිය විසින් එකී ප්‍රවාහන අත්තිකාරම් ගිණුමේ මුදල් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

*අධිකාරිය විසින් ප්‍රවාහන අත්තිකාරම් ගිණුමේ මුදල් භාවිතා කරනු ලැබිය හැකිය.*

43. අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරන තෙක්, 1992 අංක 4 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1994 පෙබරවාරි මස 11 වැනි දින අංක 805/13 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉහත 38(1) දරන වගන්තියේ විධි විධාන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද හා වලංගු නියෝග ලෙස සලකනු ලැබිය යුත්තේය.

*ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි (නියෝග).*

44. මෙම ප්‍රඥප්තිය සිංහල හා දෙමල භාෂා පාඨ අතර යම් අනුකූලතාවයන් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

45. *අර්ථ නිරූපනය :*

"අධිකාරිය", "පළාත් අධිකාරිය" යන වචන වලින් "මධ්‍යම පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය" අදහස් වන්නේය.

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ මගී ප්‍රවාහන සේවා විෂය භාර අමාත්‍යවරයා අදහස් වන්නේය.

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වන්නේය.

"පළාත්" යන වචනයෙන් මධ්‍යම පළාත අදහස් වන්නේය.

"අවසර පත්‍රය", "මගී සේවා අවසර පත්‍රය", "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "මාර්ග බලපත්‍රය" යන නම් වලින් කුමන හෝ නමකින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ විවිධ ගාස්තු මත අවසර පත්‍රයේ දක්වා ඇති මාර්ග මගින් ප්‍රවාහනය කිරීමට බස් රථයක් යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් අදහස් වන්නේය.

"බස් නැවතුම්පොල" යන වචනයේ අදහස තුළ, මහ මග දෙපස බස් නවත්වන ස්ථාන ද ඇතුලත් විය යුත්තේය.

"ගැසට් පත්‍රය" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අදහස් වන්නේය.

"පළාත් පාලන ආයතන" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන්නේය.

"මිනි බස් රථය" යන්නෙන් මෝටර් රථ වාහන පනත යටතේ මිනි බස් රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහනයක් ද, ඇතුලත් වනසේ සලකනු ලැබිය යුතුය.

"මගියා" යනු කුළී රථයක හෝ බස් රථයක ප්‍රවාහනය කෙරෙන එහෙත් රියදුරු හා බස් රථයක නම් කොන්දොස්තරවරයා ඇතුළත් නොවන පුද්ගලයෙකි.

"නියමිත" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද, යන්න අදහස් වේ.

"වෙන් වෙන් ගාස්තුව" යන්නෙන් බස් රථයක මගියෙකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තෙකුට හිමිකම් ලබාදෙන ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම අදහස් වේ.

"මගී ප්‍රවාහන සේවාව" යන්නෙන් මහා මාර්ග ඔස්සේ ගාස්තුවක් අය කරමින් මගීන් ප්‍රවාහනය කරනු ලබන සෑම වාහනයක්ම අදහස් වේ.

*උපලේඛනය 1*

මධ්‍යම පලාත තුළ පිහිටි බස් රථගාල් පිළිබඳ විස්තර

1. (අ) ගුඩ්ෂෙඩ් ප්‍රධාන බස්රථගාල
   (ආ) ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පල
   පෞද්ගලික බස්රථගාල
2. ඔරලෝසු කණුව බස්රථගාල
3. ටොරින්ටන් බස්රථ ගාල
4. පේරාදෙණිය බස්රථ ගාල
5. තලාතුඔය බස්රථ ගාල
6. දෙල්තොට බස්රථ ගාල
7. හාරගම බස්රථ ගාල
8. මහකන්ද බස්රථ ගාල
9. අම්පිටිය බස්රථ ගාල
10. කටුගස්තොට බස්රථ ගාල
11. පොල්ගොල්ල බස්රථ ගාල
12. පැණිදෙණිය බස්රථ ගාල
13. ගලගෙදර බස්රථ ගාල
14. අංකුඹුර බස්රථ ගාල
15. බොක්කාවල බස්රථ ගාල
16. මැණික්හින්න බස්රථ ගාල
17. කඩුගන්නාව බස්රථ ගාල
18. ගංහත බස්රථ ගාල
19. පොත්තපිටිය බස්රථ ගාල
20. ගෙලිඔය බස් නැවතුම්පල
21. වැලිගල්ල බස්රථ ගාල
22. ගම්පොල බස්රථ ගාල
23. පුස්සැල්ලාව බස්රථ ගාල
24. ගිනිගත්හේන බස්රථ ගාල
25. නාවලපිටිය බස්රථ ගාල
26. මස්කෙළිය බස්රථ ගාල
27. සාමිමලේ බස්රථ ගාල
28. හැටන් බස්රථ ගාල
29. තලවාකැලේ බස්රථ ගාල
30. ඩයගම බස්රථ ගාල
31. හගුරන්කෙත බස්රථ ගාල
32. මාතලේ රජවීදිය බස්රථ ගාල
33. මාතලේ ගොංගාවල බස්රථ ගාල
34. මාතලේ නුග සෙවන බස්රථ ගාල
35. රත්තොට බස්රථ ගාල
36. නාඋල බස්රථ ගාල
37. දඹුල්ල බස්රථ ගාල
38. දිගන බස්රථ ගාල
39. කරල්ලියද්ද බස්රථ ගාල
40. වත්තේගම බස්රථ ගාල
41. පන්විල බස්රථ ගාල
42. නිල්දණ්ඩාහින්න බස්රථ ගාල
43. වලපනේ බස්රථ ගාල
44. රාගල බස්රථ ගාල
45. හසලක බස්රථ ගාල
46. පුඩලුඔය බස්රථ ගාල
47. කොත්මලේ බස්රථ ගාල
48. හෙට්ටිපොල බස්රථ ගාල
49. අලවතුගොඩ බස්රථ ගාල
50. නුවරඑළිය බස්රථ ගාල
51. නුවරඑළිය පුද්ගලික බස්රථ ගාල